WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

ක්‍රිස්තියානි ධර්මය I, II
கிறிஸ்தவம் I, II
Christianity I, II

## ක්‍රිස්තියානි ධර්මය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) අති විශේෂ උපත් පිළිබඳ දේවදූත පණිවුඩයට කීකරු වී යහපත් ප්‍රතිචාර දැක්වූ **දෙදෙනෙක්** නම් කරන්න.

(ii) (අ) දිවැසිවර මලාකිගේ දිවැස්වැකිය අනුව මෙසියස් වහන්සේට පෙරටුව ගොස් මග පිළියෙළ කරන්නා වූයේ කවුද?
(ආ) මේ මගින් මොහු ජනතාවට කරන අභියෝගය කුමක් ද?

(iii) (අ) පරිසිවරුන්ගේ කේන්ද්‍රස්ථානය වූයේ කුමක් ද?
(ආ) ජේසුස් වහන්සේ විසින් පරිසිවරුන්ට විරුද්ධව නැගූ එක් චෝදනාවක් ලියා දක්වන්න.

(iv) කුරුසිපත්වූ අවස්ථාවේ ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ වදන් **දෙකක්** ලූක් සුබසුන ඇසුරෙන් ඉදිරිපත් කරන්න.

(v) ජේසුස් වහන්සේගේ බෞතිස්ම අවස්ථාවේ සහ රූප විපර්යාස සිද්ධියේදී, අහසින් නිකුත් වූ දෙවියන් වහන්සේගේ පහත ප්‍රකාශ නිවැරදිව සම්පූර්ණ කරන්න.
(අ) ඔබ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝ ය. ..................................................
(ආ) මේ මාගේ පුත්‍රයාණෝ ය, මා තෝරාගත් තැනැත්තාණෝ ය. ..................................................

(vi) යාච්ඤා ජීවිතය මගින් ජේසුස් වහන්සේ අත්දුටු යහපත් ප්‍රතිඵල **දෙකක්** ලියා දක්වන්න.

(vii) මුල් සභාව ඇසුරින් යාච්ඤාව සහ ඔවුන් සතු දේ පොදුවේ තබාගෙන බෙදා ගැනීම යන ගුණාංග දෙක මගින් කිතුනු අප ලබන ආභාස **දෙකක්** සඳහන් කරන්න.

(viii) පාවුල් තුමා සිරකරුවකු ලෙස යන ගමනේදී කුණාටු අවස්ථාවේදී පවා සිරකරුවන් දිරිගැන්වීම සහ නැවියන්ට අවවාද කිරීමෙන් විශ්වාසයට සාක්ෂි දැරීය. එතුමාගේ එම ක්‍රියාවන්ගෙන් අප ලබන මග පෙන්වීම් **දෙකක්** ලියන්න.

(ix) ප්‍රේම පාරමිතාවේ පාවුල්තුමා සඳහන් කරන මෙම වගන්තියේ හිස්තැන් නිවැරදි වචන යොදා සම්පූර්ණ කරන්න.
"........................ මට නැත්නම්, මම කරන සියලු දේ සෝෂා කරන ............................ සමාන වෙමි."

(x) ලෞකික දිළිඳු බවට හා අධ්‍යාත්මික දිළිඳු බවට හේතුවන **එක්** සාධකයක් බැගින් ඉදිරිපත් කරන්න.

**2.** මරියා **යහපත් දේ** තෝරාගෙන ඇත. එය ඇය කෙරෙන් **පහව නොයන්නේ ය.**

(i) මෙහි තද අකුරින් ලියවී ඇති පද දෙකෙන් අප ලබන පණිවිඩය ලියන්න.

(ii) ඉහත කී පාඨයෙන් ජේසුස් වහන්සේගේ ක්‍රියාකලාපය අනුව ගෝලකමට සුදුසුකම් ලැබීම සම්බන්ධයෙන් කුමක් හැඟවේ ද? හේතු **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) වත්මන් ලොව කාන්තාවන්ට සම තැන දීමේ වැදගත්කම සඳහා ජේසුස් වහන්සේගේ සෙසු අවස්ථාවල ක්‍රියාකලාපයන් ද පාදක කරගෙන, අපගේ දායකත්වය විය යුත්තේ කෙසේදැයි කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

**3.** (i) ජේසුස් වහන්සේගේ මෙහෙවරයේ මූලික තේමාව වූයේ කුමක් ද? එය ඉදිරිපත් කිරීමට උන්වහන්සේ ගත් ක්‍රියාමාර්ගයක් ලියන්න.

(ii) එම තේමාව ජනතාව අතරට ගෙන ඒමට උන් වහන්සේ උපයෝගී කරගත් වට්නාකම් **තුනක්** නිදසුන් සහිතව දක්වන්න.

(iii) එම තේමාව, උන්වහන්සේගේ ඉගැන්වීම් දක්වමින් අපි අද සමාජගත කරන්නේ කෙසේදැයි අවස්ථා **පහක්** ඇසුරෙන් විස්තර කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**4.** "හිවලුන්ට බෙනද පක්ෂීන්ට කැදලි ද ඇත. එහෙත් මනුෂ්‍ය පුත්‍රයාණන්ට හිස තැබීමට තැනක් නැත."

(i) අනුගාමිකයන් වීමට කැමැත්ත දක්වන පුද්ගලයනට ජේසුස් වහන්සේ කළ මෙම ප්‍රකාශය අනුව ලැබෙන අභියෝග **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ii) ජේසුස් වහන්සේ විසින් කැඳවනු ලැබූ අය සහ අනුගාමිකත්වයට ස්ව කැමැත්ත පළ කළ අය දුන් පිළිතුරු **තුනක්** ලියන්න.

(iii) ඉහත (ii) හි සඳහන් ප්‍රතිචාර අනුව වත්මන් සමාජයේ වෙසෙන කිතුනුවන්ට ජේසුස් වහන්සේගේ කැඳවීම කුමක් සඳහා දැයි වටහාගෙන, එයට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය කෙසේදැයි කරුණු **පහකින්** පහදන්න.

**5.** (i) දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයන් ස්ත්‍රිය හා පුරුෂයා වශයෙන් මැවූ බව වටහා ගෙන 21 වන සියවසේ වෙසෙන ඔබගේ තේරුම් ගැනීම අනුව අදහස් **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ii) එම අවබෝධය අනුව භාර්යාව හා ස්වාමි පුරුෂයා අතර තිබිය යුතු අන්‍යෝන්‍ය යුතුකම් **තුනක්** සඳහන් කරන්න.

(iii) වත්මන් සමාජයේ පවුල් සංස්ථාව මුහුණපාන අභියෝගාත්මක ප්‍රශ්න වටහාගෙන, කිතුනු වටිනාකම් අනුව ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේදැයි පහත සඳහන් පවුල/සමාජ සබඳතා යටතේ විස්තර කරන්න.

(අ) ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර
(ආ) දෙමාපියන් හා දරුවන් අතර
(ඉ) දරුවන් හා වැඩිහිටියන් අතර
(ඊ) සහෝදර සහෝදරියන් අතර
(උ) පවුල හා සමාජය අතර

**6.** (i) පාවුල්තුමාගේ පළමු, දෙවන සහ තෙවන චාරිකාවල අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

(ii) ඔහුගේ අරමුණු සාක්ෂාත් කරගැනීමට එක් එක් චාරිකාවේදී ඔහු උපයෝගී කරගත් ක්‍රමවේද උදාහරණ **තුනක්** සහිතව ලියා දක්වන්න.

(iii) ඉහත කී ක්‍රමවේද භාවිත කරමින් වත්මන් කිතුණු මෙහෙවරයේ යෙදෙන්නන් විසින් අර්ථවත් ලෙස එම අවස්ථා උපයෝගී කරගත හැකි අන්දම සාධක **පහක්** සහිතව පැහැදිලි කරන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. ඒ සඳහා දී ඇති උපදෙස් වාක්‍ය භාවිත කරන්න.

(i) මෙසියානු සංකල්පය
- කුමන දිවැසිවරු ප්‍රකාශ කළ සංකල්පයක් ද යන්න
- එම සංකල්පය ඉදිරිපත් කිරීමට පාදක වූ ජුදෙව් ආගමික පසුබිම
- එම සංකල්පය සමාජය තුළ ඇති කළ බලාපොරොත්තුව
- අද මෙසියස් තුමා තුළින් ලැබෙන ආලෝකය

(ii) එඬේර නායකත්වය
- ඉදිරිපත් කිරීමට තුඩු දුන් කරුණු
- මේ පිළිබඳ බයිබලීය අදහස්
- එම අදහස් යහපත් එඬේරා වන ජේසුස් වහන්සේ භාවිතා කළ අන්දම
- එතුමා සිය ජීවිතය තුළින් එය ගෙනහැර පෑ ආකාරය
- වත්මන් කිතුනු අප එම ගුණාංග සමාජය තුළ ප්‍රචලිත කිරීමට ගතයුතු පියවර

(iii) ජුදා සමාජ දැක්ම
- ජුදා සමාජය බිහිවීමට පුරෝගාමී වූ චරිත
- ඔවුන්ගේ මූලික ගුණාංග
- ජනතාවට ජාතියක් ලෙස ගොඩනැගීමට දුන් දායකත්වය
- ජේසුස් වහන්සේගේ දායකත්වය
- කිතුනු දැක්මට ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලින් ලද මගපෙන්වීම්

(iv) ශුද්ධාත්ම අනුහස අනුව ජීවත්වීම
- ශුද්ධාත්ම අනුහස දක්වන සංකේතාත්මක අවස්ථා
- ඒ මගින් අනාවරණය කරන වැදගත් කරුණු
- ජේසුස් වහන්සේ එම සංකේත හසුරුවන අන්දම
- කිතුනු අප ජීවිත වඩා යහපත් කරගැනීම සඳහා එම අදහස් අදාළ කරගන්නා අන්දම

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...